අ.පො.ස.(සා.පෙළ) උපකාරක සම්මන්ත්‍රණය - 2013

ඉතිහාසය I | (පැය එකයි)

සැලකිය යුතුයි :

* **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.** මෙම ප්‍රශ්න පත්‍රය සඳහා **ලකුණු 80ක්** හිමි වේ.
* අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර** තෝරන්න.

1. ලංකාවේ ඉතිහාසය හැදෑරීමට උදව් වන සාහිත්‍ය මූලාශ්‍ර අතර මහා වංශයට ප්‍රමුඛස්ථානයක් හිමි වීමට ප්‍රධාන හේතුව,
(1) වෙනත් වංශකථාවල ඇති අඩුපාඩු මග හරවා රචනා කිරීම යි.
(2) එතෙක් තිබූ අට්ඨ කථා හා පිං පොත් උදව් කර ගැනීම යි.
(3) අඛණ්ඩ ඉතිහාසයක් ගොඩ නඟා ගත හැකි වීම යි.
(4) ප්‍රධාන වශයෙන් ආගමික ඉතිහාසයක් හැදෑරීමට හැකි වීම යි.

2. ඉන්දියාවට පැමිණි ආර්යයන් දකුණු ඉන්දියානු ප්‍රදේශවලට සංක්‍රමණය වීමේදී තරණය කිරීමට සිදු වූ කඳු වැටිය කුමක් ද ?
(1) හිමාලය (2) වින්ධ්‍යා (3) හින්දුකුෂ් (4) සත්පුර

3. විදේශීය වාර්තා හා ග්‍රන්ථ ලංකාවේ ඉතිහාසය හැදෑරීමට බෙහෙවින් ප්‍රයෝජනවත් වේ. එම ග්‍රන්ථ අතුරෙන් ශ්‍රී ලංකාව 'පාර සමුද්‍ර' ලෙස හඳුන්වා ඇත්තේ කුමන ග්‍රන්ථයේ ද?
(1) ප්ලිනිගේ නැචුරාලිස් හිස්ටෝරියා (2) මෙගස්තිනීස්ගේ ඉන්ඩිකා
(3) ඇරිස්ටෝටල්ගේ ඩිමුන්ඩෝ (4) කෞටිල්‍යගේ අර්ථ ශාස්ත්‍රය

4. පහත දක්වා ඇති ස්ථාන අතුරෙන්, ප්‍රාග් ඓතිහාසික සුසාන භූමි දැකිය හැකි ස්ථාන වන්නේ,
(1) කිතුල්ගල බෙලිලෙන හා රාවණා ඇල්ල ලෙන යි. (2) ඉබ්බන්කටුව හා පොම්පරිප්පු යි.
(3) තන්තිරිමලේ හා බෙල්ලන් බැඳි පැලැස්ස යි. (4) පාහියන්ගල ලෙන හා දොරවක ලෙන යි.

5. 'අලහබාද් සෙල් ලිපිය' හා 'අලහබාද් ප්‍රශස්තිය' කවර රජවරුන්ගේ අනුග්‍රාහකත්වයෙන් පිහිටවනු ලැබූ ඒවා ද?
(1) අශෝක රජු හා සමුද්‍රගුප්ත රජු (2) චන්ද්‍රගුප්ත මෞර්ය රජු හා පළමුවන චන්ද්‍රගුප්ත රජු
(3) සමුද්‍රගුප්ත රජු හා දෙවන චන්ද්‍රගුප්ත රජු (4) අශෝක රජු හා චන්ද්‍රගුප්ත මෞර්ය රජු

6. පහත දක්වා ඇති ඓතිහාසික සිද්ධි අතුරෙන් වළගම්බා රාජ්‍ය සමයේ සිදු වූ සිද්ධි පමණක් ඇතුළත් වරණය තෝරන්න.
A - සත් ද්‍රවිඩ ආක්‍රමණය B - ජේතවන විහාරය ඉදි කිරීම
C - තීය බ්‍රාහ්මණයාගේ කැරැල්ල D - ප්‍රථම පෞද්ගලික ආරාම පූජාව
E - මේඝ වර්ණාභය ඇමතිගේ කැරැල්ල
(1) A C D (2) B D E (3) A B C (4) C D E

7. වැවක ජල පීඩනය පාලනය කොට සොරොව්ව තුළින් ප්‍රධාන ඇළට ජලය නිකුත් කිරීම සඳහා පැරණි වාරි මාර්ග ශිල්පීන් දැක්වූ තාක්ෂණික නිපුණතාවය ප්‍රදර්ශනය වන නිර්මාණය මින් කුමක් ද?
(1) සළපනාව (2) පිටවාන (3) බිසෝකොටුව (4) ඇතුළුවාන

8. පහත X හා Y ලෙස දක්වා ඇත්තේ ජලාශ්‍රිත ශිෂ්ටාචාර සමයේ නිර්මාණය වූ වැව් කීපයක් හා ඒවා නිර්මාණය කළ රජවරුන්ය. X තීරුවේ වැව් Y තීරයේ රජවරු සමග ගැළපූ විට නිවැරදි වන වරණය තෝරන්න.

"X" තීරුව	"Y" තීරුව
i අභය වැව	A - දෙවන මුගලන් රජු
ii කලා වැව	B - වසභ රජු
iii පත්පහන් වැව	C - පණ්ඩුකාභය රජු
iv ගිරිතලේ වැව	D - දේවානම්පියතිස්ස රජු
v මහවිලච්චිය වැව	E - දෙවන අග්බෝ රජු
	F - ධාතුසේන රජු

(1) C D A B F (2) D B C E A (3) C F A E B (4) D F E A B

9. ඇළ මාර්ග තාක්ෂණයේ විශිෂ්ටත්වය ප්‍රදර්ශනය වන අන්තර් ගංගා ද්‍රෝණි ඇළ මාර්ගයකට හොඳ ම නිදසුනක් සපයන්නේ පහත දැක්වෙන කුමන ඇළ මාර්ගය ද?
(1) යෝධ ඇළ (2) මිනිපේ ඇළ (3) පබ්බතන්ත ඇළ (4) රිදී බැඳි ඇළ

10. පොළොන්නරු යුගයේ වාස්තු විද්‍යාත්මක නිර්මාණ කෙරෙහි මූලික වශයෙන් බලපා ඇති කලා සම්ප්‍රදාය මින් කුමක් ද?
(1) මෞර්ය (2) ගුප්ත (3) පල්ලව (4) චෝල

11. කෝට්ටේ යුගයේ ඇති වූ භාෂා සාහිත්‍ය හා අධ්‍යාපන ප්‍රබෝධයට ආයක වූ අධ්‍යාපන ආයතන කීපයක් X තීරුවේ ද ඒවා පිහිටි ස්ථාන Y තීරුවේ ද දැක්වේ. X තීරුව Y තීරුව හා නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුර දී ඇති වරණ අතුරෙන් තෝරන්න.

"X" තීරුව	"Y" තීරුව
i විජයබා පිරිවෙන	A - කැරගල
ii පද්මාවතී පිරිවෙන	B - තොටගමුව
iii සුනේත්‍රාදේවි පිරිවෙන	C - පැපිලියාන
iv ඉරුගල් කුලතිලක පිරිවෙන	D - දෙවිනුවර

(1) D B C A (2) B C D A (3) B A C D (4) D C A B

12. හයවන පරාක්‍රමබාහු රජු යටතේ සපුමල් කුමරු යාපනය ආක්‍රමණය කර කෝට්ටේ රාජ්‍යයට ඈඳා ගත් අවස්ථාවේ යාපන රාජ්‍යයේ පාලකයා වූයේ,
(1) විජය කුලංකෛ රජු ය. (2) වික්කිරම ශිංගෛ රජු ය.
(3) වරෝදය රජු ය. (4) කනකසූරිය ශිංගෛ රජු ය.

13. මුස්ලිම් බල ව්‍යාප්තිය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශයක් සාවද්‍ය ද ?
(1) ඉස්ලාම් ධර්මයේ ආදී කර්තෘ ලෙස සැලකෙනුයේ මහම්මත් තුමාය.
(2) ඝස්නි මොහමඩ් ඉන්දියාවේ සෝමනාත් දේවාලය විනාශ කර එහි තිබූ වස්තුව කොල්ල කෑවේය.
(3) ඉන්දියානු අර්ධද්වීපය පුරා ම බලය ව්‍යාප්ත කිරීමට අක්බාර් අධිරාජ්‍යයා සමත් විය.
(4) දිල්ලි සුල්තාන් අධිරාජ්‍යයේ ආරම්භකයා වහල් රාජවංශයේ කුටුබ් උද්දීන් අයිබෙක්ය.

14. අශෝක අධිරාජයාට පසුව ඉන්දියාව තුළ ආගමික සහනශීලී ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම නිසා ශ්‍රේෂ්ඨ පාලකයෙකු ලෙස සැලකෙනුයේ මින් කවරෙක් ද?
(1) මහා අක්බාර් රජු (2) මොහමඩ් බින් කාසිම් රජු
(3) ඝූර්හි මොහමඩ් රජු (4) අලා උද්දීන් ඛල්ජි රජු

15. අල්හජ්ජාජ්, ඉල්තුත්මිෂ්, හජ්-උද්දීන්-පිරූශ් ෂා හා ක්‍රිෂ්ණ දේවරාය යන පාලකයින්ගේ බල ප්‍රදේශ පිළිවෙළින් දැක්වෙන්නේ කුමන වරණයේ ද ?
(1) දිල්ලි සුල්තානය, ඉරාකය, විජයනගරය, බහමනිය. (2) ඉරාකය, දිල්ලි සුල්තානය, බහමනිය, විජයනගරය.
(3) බහමනිය, ඉරාකය, විජයනගරය, දිල්ලි සුල්තානය. (4) ඉරාකය, බහමනිය, දිල්ලි සුල්තානය, විජයනගරය.

16. ක්‍රිස්තු භක්තිකයන් හා ඉස්ලාම් භක්තිකයන් අතර ඇති වූ කුරුස යුද්ධවලට හේතු වූයේ මින් කවර නගරයක අයිතිය ලබා ගැනීමට ද?
(1) ජෙරුසලම (2) රෝමය (3) කොන්ස්තන්තිනෝපල් (4) ෆ්ලොරන්ස්

17. යුරෝපා පුනරුද සමයේ බිහි වූ කලා කෘතිවල දක්නට ලැබෙන විශේෂත්වය වනුයේ,
(1) ආගමික මුහුණුවරක් ගැනීම. (2) ලෞකිකත්වයට නැඹුරු වීම.
(3) රාජ්‍ය අනුග්‍රාහකත්වයෙන් බිහි වීම. (4) සාමූහිකත්වයෙන් නිර්මාණය වීම.

18. යුරෝපා ජාතීන් විවිධ උපක්‍රම උපයෝගි කර ගනිමින් ආසියා, අප්‍රිකා හා ලතින් ඇමරිකානු ප්‍රදේශවල තම බලය ව්‍යාප්ත කිරීමට උත්සාහ කළ බව පෙනේ. ඉතා කෲර හා බිහිසුණු ලෙස මෙම ක්‍රියාවලියට අවතීර්ණ වූ යුරෝපා ජාතිය වන්නේ,
(1) ස්පාඤ්ඤයින් ය. (2) පෘතුගීසින් ය. (3) ඉංග්‍රීසින් ය. (4) ලන්දේසින් ය.

19. පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් ලංකාවේ පෘතුගීසි පාලනයට අදාළ පිළිතුර තෝරන්න.
A - පෘතුගීසීහු දැඩි මුස්ලිම් විරෝධී ප්‍රතිපත්තියක් අනුගමනය කළහ.
B - ව්‍යාපාරික වශයෙන් කුරුඳු වගාව ආරම්භ කිරීමත්, ඇළ මාර්ග මගින් බඩු ප්‍රවාහනයටත් පෘතුගීසීන්ගේ අවධානය යොමු විය.
C - මුහුදුබඩ ප්‍රදේශවල කතෝලික ආගම ප්‍රචාරය කිරීම තුළින් තමන්ට පක්ෂපාත ජනතාවක් ඇති කර ගැනීම ඔවුන්ගේ එක් ප්‍රයත්නයක් විය.
D - ගරිල්ලා සටන් ක්‍රමය තුළින් ස්වදේශිකයන් මර්ධනය කිරීමට ඔවුහු දක්ෂතාවයක් දැක්වූහ.
(1) A B (2) B C (3) C D (4) A C

20. පහත A B C D ලෙස දක්වා ඇත්තේ ලංකාවේ පෘතුගීසි යුගයේ ඇති වූ සටන් කීපයකි. එම සටන්වලදී පෘතුගීසින්ට නායකත්වය දුන් කපිතාන්වරු පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.
A - මුල්ලේරියාවෙල සටන B - දන්තුරේ සටන
C - බලන සටන D - රන්දෙනිවෙල සටන
(1) පේරෝ ලෝපේස් ද සූසා, දියෝගෝද මේලෝ, පෙරෙයිරා ද ලසර්දා, කොන්ස්තන්තීනු ද සා.
(2) පෙරෙයිරා ද ලසර්දා, පේරෝ ලෝපේස් ද සූසා, ජෙරනිමෝ ද අසවේදු, දියෝගෝ ද මේලෝ.
(3) පේරෝ ලෝපේස් ද සූසා, පෙරෙයිරා ද ලසර්දා, කොන්ස්තන්තීනු ද සා, ජෙරනිමෝද අසවේදු.
(4) පෙරෙයිරා ද ලසර්දා, පේරෝ ලෝපේස් ද සූසා, ජෙරනිමෝද අසවේදු, කොන්ස්තන්තීනු ද සා.

21. පහත දක්වා ඇත්තේ උඩරට රජුන් හා ලන්දේසීන් අතර ඇති වූ ගිවිසුම්වල කොන්දේසි කීපයකි.
A - පෘතුගීසින් පලවා හැරීමට ලන්දේසීන් රජුට උදව් කළ යුතු වේ.
B - මුහුදුබඩ ගව්වක් පළල බිම් තීරුවක් ලන්දේසීන්ට පැවරිය යුතුය.
C - කන්ද උඩරට වෙළඳාම, කුරුඳු තැලීම හා ඇවඳඩු කපා ගැනීමට ලන්දේසීන්ට අවසර දිය යුතු වේ.
D - සියලු යුධ වියදම් රජු විසින් දැරිය යුතුය.
ඉහත කොන්දේසි අතුරෙන් ක්‍රි.ව. 1638 ඇති වූ ගිවිසුමේ කොන්දේසි පමණක් ඇතුළත් පිළිතුර කුමක් ද?
(1) A B (2) B C (3) C D (4) A D

22. 'නිදහස සමානාත්මතාවය හා සහෝදරත්වය යන තේමා පදනම් කොට මිනිසා උතුම් කොට සැලකිය යුතුය' යන අදහස පහත සඳහන් කවර විප්ලවයක් හා සම්බන්ධද ?
(1) ඉංග්‍රීසි (2) ප්‍රංශ (3) රුසියන් (4) චීන

23. ජර්මනිය එක්සත් කිරීමේ ව්‍යාපාරයේ පුරෝගාමී මෙහෙවරක් ඉටු කරන ලද්දේ කවුරුන් විසින් ද?
(1) නැපෝලියන් බොනපාට් (2) ඔටෝ ෆොන් බිස්මාර්ක්
(3) කවුන්ට් කැමිලෝ (4) ව්ලැඩිමීර් ලෙනින්

24. 'කාර්මික විප්ලවය මිනිසාට යහපත් ප්‍රතිඵල මෙන්ම අයහපත් ප්‍රතිඵල ද අත් කර දී ඇත' කාර්මික විප්ලවයේ අයහපත් ප්‍රතිඵල ඇතුළත් වන්නේ කවර පිළිතුරේ ද?
A - යුද කටයුතුවලදී රසායනික අවි භාවිතය. B - කාර්මික අපද්‍රව්‍ය පරිසරයට නිකුත් කිරීම.
C - සමාජ විෂමතා වර්ධනය වීම. D - තරුණ පරපුර මත්ද්‍රව්‍ය භාවිතයට හුරු වීම.
(1) A B (2) B C (3) C D (4) A D

25. ලාංකික පුරවැසියන්ට, ප්‍රජාතන්ත්‍රවාදී අයිතියක් වන ඡන්ද බලයෙන් මහජන නියෝජිතයන් පත් කර ගැනීමේ අවස්ථාව ප්‍රථම වරට හිමි වන්නේ පහත දැක්වෙන කවර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් මගින් ද?
(1) කෝල්බෘක් (2) මැකලම් (3) ඩොනමෝර් (4) සෝල්බරි

26. බ්‍රිතාන්‍යයන් ආරම්භ කළ වතු වගාව නිසා උඩරට ජනතාවට මුහුණදීමට සිදු වූ බලවත් ම ගැටළුව සේ සැලකිය හැක්කේ මින් කුමක් ද?
(1) දකුණු ඉන්දියානුවන් වතු කම්කරුවන් ලෙස යොදවා ගැනීම.
(2) වතු වගාවන් සඳහා උඩරට වනාන්තර එළි කිරීම නිසා ඇති වූ පාංශු ඛාදනය.
(3) මුඩුබිම් පනත මගින් උඩරට ඉඩම් රජයට පවරා ගැනීම නිසා ඇති වූ ඉඩම් හිඟය.
(4) උඩරට ප්‍රදේශවල පැවති සමාජ හා සංස්කෘතික සාරධර්ම පිරිහී යාම.

27. කෝල්බෘක් ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක වීමේ ප්‍රතිඵලයක් ලෙස ගම්වල කෘෂි කාර්මික කටයුතු වලට අවශ්‍ය වාරි මාර්ග සේවා සැපයීම හා පොදු කටයුතු අතපසු වීමෙන් ගැමි ජනතාව මහත් අසරණ තත්ත්වයකට පත්විය. මෙයට බලපෑ ප්‍රධාන ම යෝජනාව වූයේ,
(1) එතෙක් තිබූ පළාත් දහසය පළාත් පහකට බෙදීම.
(2) රාජකාරි ක්‍රමය හා ගම් සභාවල බලතල අහෝසි කිරීම.
(3) විදේශීය ව්‍යාපාරිකයන්ට ඉඩම් ලබා ගැනීමට අවස්ථාව ඇති කිරීම.
(4) උසාවි ක්‍රමයක් ඇති කර සියලුම නඩු ඒවා වෙත යොමු කිරීම.

28. පහත දැක්වෙන්නේ බ්‍රිතාන්‍ය පාලන සමය තුළ මෙරට ඇති වූ ව්‍යවස්ථාමය වෙනස්කම් කීපයකි.
A - ව්‍යවස්ථාදායක සභාව පිහිටු වීම. B - සර්ව ජන ඡන්ද බලය ලැබීම.
C - විධායක කාරක සභා ඇති කිරීම. D - සමානුපාතික නියෝජන ක්‍රමය ඇති කිරීම.
ඉහත වෙනස්කම් අතුරෙන් ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ ඇති වූ වෙනස්කම් දැක්වෙන්නේ කවර පිළිතුරේ ද?
(1) B C (2) C D (3) C E (4) B D

29. A - නොපෙනෙන රජ කෙනෙකු යටතේ පාලනය වීමට තිබූ අකමැත්ත.
B - පුරන් අප්පු අරගලයට නායකත්වය දීම.
C - අසාධාරණ බදු ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම.
D - රදළ ප්‍රධානීන් භුක්ති විඳි වරප්‍රසාද හා ගරු බුහුමන් අහෝසි වී යාම.
ඉහත A B C D අතුරෙන් ක්‍රි.ව. 1818 නිදහස් අරගලයට හේතු වූ කරුණු ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) A B (2) B C (3) C D (4) A D

30. ඒ.ඊ. ගුණසිංහ හා නඩේසන් අයියර් යන නායකයන් දෙදෙනාට ම සම්බන්ධ පොදු කරුණ පහත දී ඇති ප්‍රකාශ අතුරෙන් තෝරන්න.
(1) නිදහස දිනා ගැනීමේදී පුරෝගාමී මෙහෙවරක් කිරීම.
(2) සංස්කෘතික ප්‍රබෝධයක් ඇති කිරීමට නායකත්වය දීම.
(3) කම්කරුවන් වෘත්තීය අයිතිවාසිකම් දිනා ගැනීමට මෙහෙය වීම.
(4) දේශීය කෘෂි කර්මාන්තය නගා සිටුවීමට ජනතාව උනන්දු කරවීම.

31. ඉන්දියාවට නිදහස ලබා ගැනීමේ අරමුණින් කල්කටාවේ බිහි වූ 'ඉන්දියානු සංවිධානය' පිහිටු වීමේ පුරෝගාමී වූ ඉන්දියානු නායකයා කවිද ?
(1) සුරේන්ද්‍ර නාත් බැනර්ජි (2) ඇලන් ඔක්ටේවියන් හියුම් (3) මහත්මා ගාන්ධි (4) සුභාෂ් චන්ද්‍ර බෝස්

32. ඉන්දියාවේ අතීතය නිරාවරණය කර ගත හැකි වීම, ඉන්දියානුවන් තුළ මහත් ප්‍රබෝධයක් ඇති වීමට හේතු විය. මෙම නිරාවරණය කර ගැනීම සඳහා ඉදිරිපත් වූ පුද්ගලයන් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) මැක්ස්මුලර්, ජෝන් මාර්ෂල්, මෝතිලාල් නේරු (2) මැක්ස්මුලර්, මහත්මා ගාන්ධි, ලාලා ලජ්පත් රායි
(3) මෝටිමර් වීලර්, ජවහර් ලාල් නේරු, මහත්මා ගාන්ධි (4) ජෝන් මාර්ෂල්, මැක්ස්මුලර්, මෝටිමර් වීලර්

33. ජපානයේ ටොකුගාවා ෂෝගුනේට්වරුන්ගේ පාලනය හා සම්බන්ධව **නොගැළපෙන** ප්‍රකාශය තෝරන්න.
(1) සමුරායිවරු බෙහෙවින් නොවැදගත් තත්ත්වයකට පත් වූහ.
(2) යුධ අවි දැරීම ගොවීන්ට තහනම් විය.
(3) පහළ මට්ටමක සිටි ඩයිමියෝවරු පාලකයන් බවට පත් වූහ.
(4) කෘෂි කර්මාන්තය නොසලකා හැරීම නිසා අස්වනු අඩු විය.

34. ජාතිකවාදය, ප්‍රජාතන්ත්‍රවාදය හා ජීවන වෘත්තිය යන අංග ඇතුළත් වූයේ,
(1) මා ඕ සේතුංගේ මතවාදය අනුව සකස් වූ කොමියුනිස්ට් පක්ෂයේ දර්ශනයෙහි ය.
(2) සුන් යත් සෙන්ගේ මතවාදය අනුව සකස් වූ කුවෝමිංතාන් පක්ෂයේ දර්ශනයෙහි ය.
(3) චියෙන් කායි ෂෙක්ගේ මතවාදය අනුව සකස් වූ කුවෝමිංතාන් පක්ෂයේ දර්ශනයෙහි ය.
(4) මයිකල් බරෝඩීන්ගේ මතවාදය අනුව සකස් වූ සෝවියට් කොමියුනිස්ට් පක්ෂයේ දර්ශනයෙහි ය.

35. 'ලක්ෂ ගණන් ජනතාව විප්ලවය කරන විට එය කුණාටුවක් හෝ ටොනාර්ඩෝවක් විය හැක' යනුවෙන් මා ඕ සේතුං විසින් ප්‍රකාශ කරන විට එහි අදහස වූයේ,
(1) විප්ලවය කරන අවස්ථාවේ කුණාටු හා ටොනාර්ඩෝ ඇති විය හැකි බව ය.
(2) විප්ලවය සිදුවන විට ජනතාවට බොහෝ අසීරුතාවලට මුහුණ දීමට සිදුවන බව ය.
(3) විප්ලව සමයේ ජනතාව විශාල ලෙස මිය යා හැකි බව ය.
(4) ජනතාව ලක්ෂ ගණන් විප්ලවයට සම්බන්ධ නොවිය යුතු බව ය.

36. දෙවන ලෝක මහා යුද්ධයෙන් පසුව බිහි වූ මාර්ෂල් සැලැස්මෙහි මූලික අරමුණ වූයේ කුමක් ද?
(1) යුධ සමයේ පිරිහීමට පත් වූ යුරෝපා වෙළඳපළ යථා තත්ත්වයට පත් කිරීම ය.
(2) යුද්ධයෙන් විනාශයට පත් වූ යුරෝපා රටවලට ආර්ථික ආධාර සැපයීම ය.
(3) යළි යුද්ධයක් ඇති නොවන සේ සාමකාමී පරිසරයක් ඇති කිරීම ය.
(4) සෝවියට් පිලට අයත් රටවල යුධ ශක්තිය පාලනය කිරීම ය.

37. තම බලය ව්‍යාප්ත කිරීම සඳහා දෙවන ලෝක යුධ සමයේ 'ගෙස්ටා පෝ' නමින් රහස් පොලිසියක් ද 'එස් එස්' නමින් රහස් හමුදාවක් ද යොදා ගත් ජර්මන් නායකයා කවිද?
(1) ඔටෝ ෆොන් බිස්මාර්ක් (2) දෙවන විලියම් කෛසර් (3) ඇඩොල්ෆ් හිට්ලර් (4) බෙනිටෝ මුසලෝනි

38. පහත දැක්වෙන්නේ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවල වූ මූලික ලක්ෂණ කිහිපයකි. ඒවා අතරෙන් 1972 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාවට අදාළ ලක්ෂණ පමණක් ඇති පිළිතුර තෝරන්න.
A - බෞද්ධාගම රාජ්‍ය ආගම බවට පත් කිරීම. B - සමානුපාතික නියෝජන ක්‍රමයක් ඇති කිරීම.
C - 'ලංකා' යන්න 'ශ්‍රී ලංකා' ලෙස හැඳින්වීම. D - ජනතා පරමාධිපත්‍යය පිළිගැනීම.
E - විධායක ජනාධිපති කෙනෙක් පත් කිරීම.
(1) A B D (2) B C E (3) A C D (4) C D E

39. දෙවන ලෝක යුද්ධයෙන් පසු බිහි වූ ලෝක බල කඳවුරු දෙකට නොබැඳි ස්වාධීනව තම විදේශ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ අරමුණින් පිහිටුවා ගත් නොබැඳි ජාතීන්ගේ සංවිධානයේ පුරෝගාමී නායකයන් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) ජවහර්ලාල් නේරු, මාර්ෂල් ටිටෝ, අබ්දුල් ගමාල් නසාර්, සුකර්නෝ
(2) වින්ස්ටන් චර්චිල්, මොහමඩ් අලිජින්නා, ෆ්‍රැන්ක්ලින් රූස්වේල්ට්, සුකර්නෝ
(3) අබ්දුල් ගමාල් නසාර්, ජවහර්ලාල් නේරු, ෆිදෙල් කැස්ත්‍රෝ, චාල්ස් ඩි ගෝල්
(4) ෆ්‍රැන්ක්ලින් රූස්වේල්ට්, මාර්ෂල් ටිටෝ, සුකර්නෝ, මොහමඩ් අල් ගඩාෆි

40. මහ බ්‍රිතාන්‍යයේ යටත් විජිත ලෙස තිබී පසුව නිදහස ලබා ගත් රටවල් තව දුරටත් එකමුතුව කටයුතු කිරීමේ අරමුණින් පිහිටුවන ලද ජාත්‍යන්තර සංවිධානය කුමක් ද?
(1) පොදු රාජ්‍ය මණ්ඩලය
(2) සාර්ක් සංවිධානය
(3) වෝර්සෝ ගිවිසුම් සංවිධානය
(4) උතුරු අත්ලාන්තික් ගිවිසුම් සංවිධානය (N.A.T.O)

***

අ.පො.ස.(සා.පෙළ) උපකාරක සම්මන්ත්‍රණය - 2013

ඉතිහාසය II | (පැය තුනයි)

සැලකිය යුතුයි :

* **I** කොටසේ **පළමුවන** ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.
* **II** කොටසින් ප්‍රශ්න **තුනකට** ද **III** කොටසින් ප්‍රශ්න **දෙකකට** ද පිළිතුරු සපයන්න.

I කොටස

1. (අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන **සියල්ල ම**, සපයා ඇති **ශ්‍රී ලංකා** සිතියමෙහි ද (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන **සියල්ල ම**, සපයා ඇති **ලෝක** සිතියම් කොටසෙහි ද ලකුණු කර නම් කරන්න.

(i) ගඟසිරිපුර, මින්නේරිය වැව, අඟමැඩිල්ල අමුණ, රිටිගල, කෝට්ටේ, පොම්පරිප්පු, ඌරාතොට, කාචරගාම, දේවනගර, ගාල්හ නදී. (ලකුණු 10යි)

(ii) ක්‍රිෂ්ණා ගඟ, සුප්පාරකතොට, නාගසාකි, තායිවානය, ජාවා දූපත, පර්සියන් බොක්ක, වෙනීසිය, ලිස්බන් (ලකුණු 08යි)

(ආ) (i) පහත A, B, C, D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු හා සම්බන්ධ ස්ථාන අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.
A - පළමුවන රාජසිංහ රජු (ටිකිරිබණ්ඩාර කුමරු) පෘතුගීසීන් අන්ත පරාජයට පත්කළ ස්ථානය සඳහන් කරන්න
B - ක්‍රි.ව. 1453 දී ඔටෝමන් තුර්කින් යටත් කරගත් නැගෙනහිර රෝම අධිරාජ්‍යයට අයත්ව තිබූ නගරය කුමක්ද ?
C - දන්ත කුමරු හා හේමමාලා යුවල දන්ත ධාතුන් වහන්සේ රැගෙන ලක්දිවට ගොඩබට වරාය නම් කරන්න.
D - ශ්‍රී ලංකාවේ බෞද්ධ, හින්දු, ඉස්ලාම් හා ක්‍රිස්තියානි බැතිමතුන්ගේ සහජීවනය පිළිබිඹුවන පොදු ආගමික සිද්ධස්ථානයක් ලෙස ගෞරව ආදරයට පත්ව ඇති පූජනීය ස්ථානය කුමක් ද? (ලකුණු 04යි)

(ii) 1. යාබද රූපයේ දැක්වෙන පුද්ගලයාගේ නම කුමක් ද?
2. මෙතුමා කුමන ජාතිකයෙක් ද?
3. මෙතුමාගේ මැදිහත් වීමෙන් ශ්‍රී ලංකාවේ පිහිටුවා ගන්නා ලද සමිතිය හැඳින්වූයේ කුමන නමකින් ද?
4. මෙතුමාගේ නායකත්වයෙන් ආරම්භ කළ පාසල් **දෙකක්** නම් කරන්න.
(ලකුණු 04යි)



(iii) 1. යාබද රූපයේ දැක්වෙන පුද්ගලයාගේ නම කුමක් ද?
2. මෙතුමා කුමන ජාතිකයෙක් ද?
3. මෙතුමාගේ නායකත්වයෙන් නව ලොවට දායාද කළ නිර්මාණය කුමක් ද?
4. විද්‍යා ක්ෂේත්‍රයට කළ සේවය නිසා ම මෙතුමා හැඳින්වීමට යොදා ගත් අන්වර්ථ නාමය කුමක් ද ?
(ලකුණු 04යි)